www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රුසියාවේ සංස්කෘතික සිද්ධීන්හි මාතෘකාව බවට පත්ව ඇති ට්‍රොට්ස්කි

## Trotsky the subject of cultural events in Russia

**ව්ලැඩිමීර් වොල්කොව් විසිනි**
**2010 මාර්තු 10**

රුසියාවේ මෑත මාසවල පැවති සංස්කෘතික ඉසව් දෙකක, එනම් ශාන්ත පීටර්ස්බර්ග්හි දේශපාලන ඉතිහාසය පිලිබඳ රාජ්‍ය කෞතුකාගාරයේ ප්‍රදර්ශනයකත්, රූපවාහිනියෙන් විසුරුවාහල වාර්තා චිත්‍රපටයකත් මාතෘකාව බවට පත්ව තිබුනේ ලියොන් ට්‍රොට්ස්කි ය. මෙම අවස්ථා දෙක තුලම අවධානය දිනාගත් තොරතුරු අතුලත්ව තිබුනු අතර වර්තමානයේ රුසියාව තුල ආකෘතික වශයෙන් දක්නට ලැබෙනවාට වඩා වෙනස් අයුරක් ගනිමින් ට්‍රොට්ස්කිගේ ඓතිහාසික භූමිකාව පිලිබඳව වෛෂයික අගැයීමක් සම්පාදනය කලේය. ව්ලැඩිමීර් පූටින් හා ඔහුගේ තන්ත්‍රය විසින් ආන්තික ජාතිකවාදය නඟාසිටුවීමටත්, ජෝසෆ් ස්ටැලින් පුනස්ථාපනය කිරීම සඳහාත් විවෘතව දරන ලද උත්සාහයේ පසුබිමට එරෙහිව සලකන කල මෙය විශේෂයෙන්ම සත්‍යයකි. එසේ වුව ද කෞතුකාගාර ප්‍රදර්ශනයට හා චිත්‍රපටයට නිශ්චිත සීමා පැවති අතර ඒවා ට්‍රොට්ස්කි හා ඔක්තෝබර් විප්ලවයට හා ට්‍රොට්ස්කිට එල්ල කරනලද පැරනි අවලාදයන්ගේ පුනර්කරනය සඳහා වේදිකාව සැපයීය.

1917 වසන්තයේදී බොල්ශෙවික් පක්ෂයේ මූලස්ථානය ලෙස යොදාගත් ගොඩනැගිල්ල තුල පසුගිය වසරේ නොවැම්බර් 6 දින සිට දෙසැම්බර් 9 දින දක්වා පැවති *විප්ලවයේ සිංහයාඃ ලෙව් ඩෙවිඩොවිච් ට්‍රොට්ස්කිගේ උපන් දිනයේ සිට වසර එකසිය තිහක්* යන ප්‍රදර්ශනය නරඹන්නන්ට විවෘත විය.

බැලරිනා මැටිල්ඩා කෂෙසින්ස්කායා ගේ මන්දිරයව පැවති මෙම ගොඩනැගිල්ල තුල සෝවියට් යුගයේදී, විප්ලවයේ කෞතුකාගාරය පිහිටුවා තිබුනි. එම අවධියේදී ට්‍රොට්ස්කි හා රුසියානු විප්ලවය තුල ඔහු දැරූ ස්ථානය පිලිබඳව සාධනීයවූ කිසිවක් සඳහන් කිරීම වලකමින් එහි කෞතුක භාන්ඩ හා ප්‍රදර්ශන ස්ටැලින්වාදයේ බලපෑමට දැඩි ලෙස නතුව තිබුනි.

පසුගිය ශීත ඍතුවේ පැවති ප්‍රදර්ශනය කෞතුකාගාරයේ නවීන ශාලාවක පරිශ්‍රයට සීමාවී හා පැවැත්වූයේ මාසයක කාලයක් පමනක් වුවත්, එයට යොදා තිබුනු නමත් ප්‍රදර්ශන භාන්ඩවල ලක්ෂනත් ට්‍රොට්ස්කිගේ ජීවිතය පිරික්සා බැලීම කරා යොමුවූ සානුකම්පික ආකල්පයක් පෙන්නුම් කලේය.

දේශපාලන ඉතිහාසය පිලිබඳ මෙම කෞතුකාගාරය පාලනය කරන රුසියානු සංස්කෘතික අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය, ප්‍රදර්ශනය ගැන එහි විස්තර විචාරයේදී මෙසේ ප්‍රකාශ කලේය. ඔහු "වෘත්තීය විප්ලවවාදියෙක් හා දේශපාලන නායකයෙකි. ට්‍රොට්ස්කි පීට්‍රෝග්‍රෑඩ් ඔක්තෝබර් නැගිටීමේ නායකයන් අතරින් එක් අයෙකි. සෝවියට් රාජ්‍යය ස්ථාපිත කිරීමට හා සිවිල් යුද්ධයේදී රතු හමුදාව ගොඩනැගීමට ඔහු ලබා දුන් දායකත්වය සුලු පටු නොවේ."

ප්‍රදර්ශනයේ මුද්‍රිත ලියවිලි තුල ද එම අදහස අන්තර්ගතවූ අතර එයට එකතු කිරීමක් වශයෙන් "1930 දී ඔහු ස්ථිරසාරව හා අශමනීය ලෙස ස්ටැලින්වාදය හෙලිදරව් කල පුද්ගලයා ද විය." යන්න ද ඇතුලත් කර තිබුනි.

"1905 දී රුසියාවට පැමින පලමුවන රුසියානු විප්ලවයට ක්‍රියාකාරී ලෙස සහභාගී වූ කාලය තුල" ට්‍රොට්ස්කි "නොනවතින විප්ලවයේ" න්‍යාය වර්ධනය කරන ලදැයි එය ප්‍රකාශ කලේය. මෙම න්‍යායේ සාරය ඔහු "පහත සඳහන් ආකාරයට විස්තර කලේය." "සමාජවාදී විප්ලවය ජාතික කරලියේ ආරම්භවී, ජාත්‍යන්තර කරලියේ වර්ධනයවී, ලෝක කරලියේ විකසිත වන්නේය."

ප්‍රදර්ශනයට ඇතුලත්ව තිබූ ප්‍රදර්ශන භාන්ඩ වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් කෞතුකාගාර කාර්ය මන්ඩලය විසින් තෙමේම අවදානම ගනිමින් ආරක්ෂාකල ඒවා විය. මේවා අතර, 1903 රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ලේබර් පක්ෂයේ දෙවෙනි සම්මේලනයට සහභාගී වූවන්ගේ ඡායාරූපයක්, පීට්‍රෝපැව්ලොව්ස්ක් බලකොටුවේ සිර කුටියක සිටින ට්‍රොට්ස්කිගේ ඡායාරූපයක්, 1926 වසරේ යූරි ඇනන්කොව්ගේ ලිතෝ මුද්‍රනයක්, 1906 වසරේ පලකරන ලද *අපගේ දේශපාලන කාර්යභාරය* නමැති ට්‍රොට්ස්කිගේ පත්‍රිකාවක්, ප්‍රකට විප්ලවවාදියෙකු වූ වික්ටර් සර්ජ්ගේ පුත් මෙක්සිකානු කලාකරු ව්ලැඩිමීර් කිබෙල්චික් (1920-2005) විසින් නෙලන ලද "ට්‍රොට්ස්කි සිහිපත් කිරීම සඳහා" යන මූර්තියක් ඇතුලත් විය.

1930 ගනන්වල ආරම්භයේ සිට ට්‍රොට්ස්කි හා ඔහුගේ පුත් ලියොන් සෙඩොව් විසින් රචිත ලිපිලේඛනවල මුල් පිටපත් ගනනාවක්ම කෞතුකාගාරය ප්‍රදර්ශනයට ඉදිරිපත්කොට තිබුනි. විශේෂයෙන්ම ඔස්ලෝ නගරයේ සෝවියට් දූත මන්ඩලයේ සුලු නිලධාරියෙකු වූ පී. එස්. කුරෙයිදෝව් අමතන ලද ලිපි ද ඒ අතර විය. මෙම ලිපි ලේඛන සොයාගන්නා ලද්දේ සෝවියට් විශේෂ සේවාවේ හිටපු නිලධාරියෙකු විසිනි.

ප්‍රදර්ශන භාන්ඩ අතර 1925 පලමු සෝවියට් ගුරු සම්මේලනයේ නියෝජිතයන් වෙත බෙදා හරින ලද හිස් පලඳනාවක් ද යමෙකුට දැකගත හැකි විය. එහි හරි මැද ලෙනින්ගේ ප්‍රතිරූපයක් ගොතා තිබුනු අතර කොන් තුනක මාක්ස් එංගල්ස් හා කැලිනන්ගේ ආලේඛන දැකිය හැකි විය. හතරවන කොටුවේ තිබී ඇත්තේ ට්‍රොට්ස්කිගේ ආලේඛනයයි. එහෙත් එය ඉවත් කර හිස් රෙදි කඩක් මසා තිබුනි.

ප්‍රදර්ශන භාන්ඩ වලින් එකක් මීට පෙර වර්ගීකරනය කල ලේඛනාගාර ලියවිල්ලකි. එනම්, ට්‍රොට්ස්කි ඝාතනය පිලිබඳව ප්‍රව්ඩා පත්‍රයට ලියන ලදුව ස්ටැලින්ගේ අත් අකුරින් කරනලද වෙනස්කම් සහිත ලිපියක කෙටුම්පතකි. "ට්‍රොට්ස්කිගේ අපකීර්තිමත් මරනය" යන එහි ශීර්ෂපාඨය "ජාත්‍යන්තර ඔත්තුකරුවෙකුගේ මරනය" යනුවෙන් ස්ටැලින් විසින් වෙනස්කර තිබුනි. එමෙන්ම කෙටුම්පතේ අවසානය ද වෙනස්කර ඇත. "තවත් එක පුද්ගලයෙක්, ගොරතර ඔත්තුකාරයෙක් හා ඒජන්තයෙක්, කම්කරුවන්ගේ ශාපලත් සතුරෙක් ධනේශ්වර ලෝකයේ දේශපාලන කරලිය හැරගොස් තිබේ" යන අවසන් වැකිය කපාහැර ඇත. එම ස්ථානයේ, ට්‍රොට්ස්කි, "ඔහුගේම කුයෝපක්‍රම, පාවාදීම්, ද්‍රෝහිකම්වල හා සාහසික අපරාධවල ගොදුරක්වී ඇත" යන්න ලියා තිබේ.

කෙසේ වෙතත්, ජීවමාන සාක්ෂියක් වශයෙන් ප්‍රදර්ශනයේ අවිවාදිත අගය එසේ තිබිය දී ම, සමස්තයක් වශයෙන් ප්‍රදර්ශන භාන්ඩ සැකසහිත හැඟීමකට ඉඩ තබයි. කෞතුකාගාර පුවත් සේවාව සඳහන් කරන පරිදි ප්‍රදර්ශනයේ කර්තව්‍යය වූයේ, "විප්ලවවාදියෙකුගේ පෞරුෂය පිලිබඳව විවිධ දෘෂ්ටිකෝනයන් ගෙනහැර දැක්වීමයි. එනම්, සමහරවිට විචිත්‍රාද්භූත කරනලද සාධනීය අගැයීම් හා නිෂේධනීය වූ නිල සෝවියට් අගැයීමයි."

මෙම ආස්ථානය මත පිහිටා සිටිමින් තර්කය ගොඩනගා ඇත්තේ, ට්‍රොට්ස්කි පිලිබඳ පැරනි මුසාවාද හා ඔහුට එල්ල කල ප්‍රහාර බොහොමයක් ප්‍රතිනිර්මානය කිරීම ඉතිහාසය පිලිබඳව "වෛෂයික" ගිනුමක අත්‍යවශ්‍ය මූලිකාංගයක් බව පවසමිනි. අවාසනාවකට මෙන්, ප්‍රදර්ශනයේ සමස්ත තුලනය "නිෂේධනීය නිල සෝවියට් අගැයීමට" වැඩි අවධාරනයක් යොදා තිබුනි. විශේෂයෙන්ම එම "අගැයීම" මනාව ප්‍රකටව තිබියදී හා ඓතිහාසික සත්‍යය සමඟ මොනම සම්බන්ධයක් හෝ නැතැයි දැනටමත් වටහාගනු ලැබ තිබියදී ය.

නිදසුනක් ලෙස, ට්‍රොට්ස්කිගේ විකට රූපවලට ප්‍රමුඛ තැනක් ලබාදී තිබීම දැක්විය හැකිය. ශාලාවේ එක් කොටසක ප්‍රතිවිප්ලවවාදී, ප්‍රතිකොමියුනිස්ට්වාදී කලාකරුවන් විසින් අඳින ලද සිවිල් යුද්ධ සමයේ උපහාසාත්මක පෝස්ටර් විය. එහි විරුද්ධ පැත්තේ තිබුනේ ට්‍රොට්ස්කි, "සෝවියට් පාලනයේ අංක එකේ සතුරා" ලෙස ප්‍රකාශයට පත්කල 1930 ගනන්වල මොස්කව් හොරනඩු කාලයේ විකට චිත්‍රය".

ප්‍රදර්ශනය ඉඳුරාම, මිඛායෙල් ගොර්බචෙව් ගේ පෙරෙස්ට්‍රොයිකා (ආර්ථික ප්‍රතිසංස්කරන) අවධියේ ආධිපත්‍ය දැරූ අගැයීම් කරා ආපසු පැමිනෙයි. එකල පාර්ශවීය ලෙස ට්‍රොට්ස්කි පුනස්ථාපනය කිරීම සමඟ එකට කලතා, ඔහුගේ පෞර්ෂය හා ඔහු මූර්තිමත් කල ජාත්‍යන්තර විප්ලවවාදී සමාජවාදී වැඩපිලිවෙල පිලිබඳව පලවූ පැරනි නිෂේධනීය උපක්‍රම බොහොමයක් එහි විය. *විප්ලවයේ සිංහයා* තුල ට්‍රොට්ස්කිගේ ඓතිහාසික භූමිකාව වාචිකව පිලිගෙන තිබීමට හිලව් වශයෙන්, ඔහුට එරෙහිව ගෙතූ සාවද්‍ය චෝදනා හා දුෂ්ඨ මුසාවාද මගින් ඇතිකල මුලුමනින්ම නිෂේධනීය දෘෂ්‍යමාන හැඟීම ඕනෑවටත් වඩා උලුප්පා තිබුනි.

මේ අයුරින් කෞතුකාගාරයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් ඉලේනා කොස්ටියුෂේවා, "රටතුල ට්‍රොට්ස්කි අධ්‍යයනය" ප්‍රවර්ධනය කිරීමේ නිශ්චිත ඉදිරි පියවරක් යයි ප්‍රදර්ශනය ගැන කල හැඳින්වීම සමඟ එකඟවීම දුෂ්කරය. ඊට වඩා විප්ලවයේ සිංහයා, යනු සංකේතාත්මක ඉඟියක් යයි පැවසීම වඩා නිරවද්‍ය වනු ඇත. සැබවින්ම එහි අන්තර්ගතව තිබුනු දෙයට වඩා එම ඉඟියෙන් ගෙනහැර දැක්වුනු දේ බෙහෙවින් වැදගත්ය.

*ට්‍රොට්ස්කි වෙත හිම පොරවක්: පලිගැනීමේ ක්‍රියාවක පුරාවෘත්තය* යන මැයෙන්, මාර්තු හතරවනදා සවස ප්‍රධාන රාජ්‍ය රූපවාහිනී නාලිකාව වන රොසියා විසින් විකාශනය කල වාර්තා චිත්‍රපටයෙන් ද ප්‍රේක්ෂකයා පිටමං කරන්නේ ට්‍රොට්ස්කි ගැන එවැනිම ව්‍යාකූල හැඟීමක් ඇතිවය.

එරීනා චර්නෝවා විසින් රචිත මැක්සිම් ෆේටල්බර්ග් විසින් අධ්‍යක්ෂනය කල විනාඩි 55 ක මෙම චිත්‍රපටය, එලීනා චෙචකවඩ්සේ විසින් නිර්මානය කල *ලෙව් ට්‍රොට්ස්කිː ලෝක විප්ලවයේ රහස* නමැති වාර්තාමය චිත්‍රපටය වැනි මෑත වසරවල එලි දැක්වුනු සමහර නිෂ්පාදනවලින්, සාධනීය හා කැපී පෙනෙන ආකාරයකින් වෙනස්වේ.

2007 වසර ආරම්භයේදී තිරගතවූ පසුව කී චිත්‍රපටය තුල ට්‍රොට්ස්කි නිරූපනය කලේ, රුසියානු ජනතාවගේ හා සුවිශිෂ්ඨ රාජ්‍යයේ සතුරෙකු ලෙසය. ඔහුගේ ජීවිතය පුරා ඔහු, ලෝකයේ සෑම සියලු අධිරාජ්‍යවාදී ආන්ඩුවලම ඒජන්තයෙකු වූ බවට හා යුදෙව් "බැංකුකරුවන්ගේ ජාත්‍යන්තරයේ" අතකොලුවක් ලෙස සේවය කල බවටත් ට්‍රොට්ස්කිට එයින් චෝදනා එල්ල කරනු ලැබිනි.

චෙචකවඩ්සේගේ චිත්‍රපටයේ තෝරාගත් උධෘතයන්ගෙන් ප්‍රකාශ වූයේ "ලෙව් ට්‍රොට්ස්කි වනාහි 20 සියවසේ රුසියානු ඉතිහාසයට අයත්වන විනාශකාරීම පුද්ගලයන්ගෙන් කෙනෙකු" බවය. "ඔහුගේ නාමය රාජ්‍යයේ බේදවාචකය පිලිබඳ ප්‍රමුඛ සිද්ධීන් සමග, එනම්, ඊනියා නිර්ධන පන්ති විප්ලවය, ව්‍යසනකාරී බ්‍රෙස්ට්ලිටොව්ක් ගිවිසුම, සිවිල් යුද්ධය, 'රතු භීෂනය' හා රට කොල්ලකෑම සමග බැඳී ඇත."

ඊට වෙනස් ආකාරයෙන්, චර්නෝවා හා ෆේටල්බර්ග්ගේ නව චිත්‍රපටය, ඓතිහාසික වාර්තාව පිලිබඳ වඩාත් වැදගත් අගැයීමක් සපයයි. "ට්‍රොට්ස්කිට අපූරු චරිතාපදානයක් හිමිව තිබුනි. ඔක්තෝබර් විප්ලව සමයේ ට්‍රොට්ස්කි තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටුකල අතර විප්ලවය පුරාවට ම නිදාසිටි පුද්ගලයා වූයේ ස්ටැලින්ය." එසේ පවසන්නේ විස්තර කථකයාවූ ඉතිහාසය පිලිබඳ මහාචාර්ය ඔලෙග් බුඩ්නිස්කිය. ඔහු මෙසේද පවසයි. "1917 හා 1918 වසරවල ජනතාව ට්‍රොට්ස්කි අනුගමනය කල අතර ඔහු රතු හමුදාව නිර්මානය කලේය."

චිත්‍රපටයේ තවත් හවුල්කරුවෙකුවූ රුසියානු ඉතිහාසය පිලිබඳ ආයතනයේ අධ්‍යක්ෂ අන්ද්‍රේ සකාරොව් මෙසේ පවසයි. "වීකේවී(බී) හි (මොස්කව් නඩු විභාග) ඉතිහාසයේ කෙටි ගමන් මග තුල ඉතිහාසය පිලිබඳ සමස්ත මුසාකරනයන්ම ගැබ්ව තිබේ. 1918 සිට ට්‍රොට්ස්කිට සමීපව සිටි සෑම අයෙක්ම වෙඩි තබා මරා දැමීය."

මොස්කව් නඩු විභාග පැවති අවධියේ ට්‍රොට්ස්කිට එරෙහිව ගෙන ආ සියලු චෝදනා විභාග කල ඩෙව් කොමිසම, ස්ටැලින්ගේ චෝදනා මුලුමනින්ම පදනම් විරහිත බව අවිවාදිතව ඔප්පු කලේ හා ලෝක ජනමතය ඉදිරියේ ට්‍රොට්ස්කිගේ නිර්දෝෂීභාවය තහවුරු කලේ කෙසේදැයි චිත්‍රපටය විස්තර කරයි.

ස්ටැලින් විසින් ඝාතනය කරන ලද ට්‍රොට්ස්කිගේ දරුවන් ගැන කථාකිරීමේදී චිත්‍රපටය, දේශපාලනික අවස්ථානුකූල වී යයි සඳහන් කරමින් ට්‍රොට්ස්කි, සාර් හා ඔහුගේ ලමුන් ඝාතනය කිරීම යුක්ති යුක්ත කලේය යන ප්‍රකාශයකින් ඌන පූරනය කලේය. පැහැදිලිව ම මෙයින් යලි වතාවක් "ට්‍රොට්ස්කිගේ ක්‍රමෝපායන්" ඔහුට ම එරෙහිව පිහිටියේය යන නිගමනය ගලා ආ යුතුය. ඓතිහාසික සන්දර්භයෙන් උගුලුවාගත් සාධක යොදාගනිමින් ගෙන එන මේ සියලු "සාදෘෂ්‍යයන්" චිත්‍රපටයේ විද්‍යාත්මක වටිනාකම පිරිහෙලන අතර සැඟවුනු දෙවන ගනයේ පරමාර්ථයක් හෙලිදරව් කරයි. එනම්, විප්ලවයේ නාටකාකාර සිදුවීම්, ස්ටැලින්ගේ අපරාධ සමග සමාන කිරීම හා එමගින් ධනේශ්වර ලෝක පර්යායේ ප්‍රචන්ඩත්වයට හා පීඩාවට විකල්පයක් ලෙස සමාජයේ සමාජවාදී පරිවර්තනයක් පිලිබඳ අදහස අවමානයට ලක් කිරීමයි.

එසේ වුවත් රුසියානු සංස්කෘතියෙහි ප්‍රධාන "ප්‍රවාහයේ" ආකෘතිය තුල ට්‍රොට්ස්කි පිලිබඳ මෙම වඩා අනුවේදී අගැයීමෙහි ඉස්මතුවීම සැලකිල්ලට ගත යුතුය. මෙයට පිටුපසින් සිටින අයගේ අභිලාශයන් කෙතරම් බැරෑරුම් ද? පිලිතුර, සමකාලීන රුසියාව තුල වර්ධනය වන්නාවූ මෙම සමාජ-දේශපාලන ක්‍රියාදාමය පිලිබඳ වඩාත් පොදු අගැයීමක් හා බැඳී පවතියි.

ප්‍රථමකොටම, ධනවාදය පුනස්ථාපනය කිරීමේ ප්‍රතිපල වශයෙන් ඉතිහාසය පිලිබඳ දැනුමේ පරිහානිය හා සමාජ-දේශපාලන වාතාවරනයේ පිරිහීම, ඉතිහාසය පිලිබඳ අව්‍යාජ දැනුම සඳහා වෛෂයික නැමියාවක් නිර්මානය කර තිබේ. මහජනතාව නිමක් නැති ව්‍යාජ හෙලිදරව්කිරීම් වලින් හා නොබැරෑරුම් සමපේක්ෂනයන්ගෙන් හෙම්බත්ව සිටියි.

වරප්‍රසාදිත පුද්ගලික දේපල හිමියන් ස්ථරයකගේ සේවය වෙනුවෙන්, ඓතිහාසික මුසාකරනයේ නව ගුරුකුලයක් නිර්මානය කිරීමට හේතුවක් ලෙස යොදාගෙන තිබෙන, ගොර්බචොව්ගේ පෙරෙස්ට්‍රොයිකා අවධියේදී මාධ්‍ය තුල නිරන්තරයෙන් සඳහන් කෙරුනු ඉතිහාසයේ "හිස්තැන්," පශ්චාත් සෝවියට් දශක දෙක තුලදී වැඩිමනත් ලෙස "පුරවා" නැත.

අනෙක් අතට, ජනාධිපති දිමිත්‍රි මෙඩ්විඩෙව් හා අගමැති ව්ලැඩිමීර් පුටින් අතර පවතින ආතතීන් තුල ප්‍රකාශිත වන, රුසියානු පාලක ප්‍රභූ පැලැන්තිය තුල වැඩෙන පසමිතුරුකම්වල දෘෂ්ටිමය මානයන් පවතියි.

රුසියානු ජාතිකවාදය, බලාධිකාරය හා ස්ටැලින්වාදය පුනස්ථාපනය කිරීමේ දිසාවට නිල දෘෂ්ටිවාදයේ හා ප්‍රචාරනයේ තියුනු පැද්දීමක් සමග පුටින් බලයට පත්වීම අත්වැල් බැඳගත්තේය. ඊට පටහැනි ලෙස, මෙඩ්විඩෙව්ගේ පරිවාරකයන් අතර ප්‍රබල හඬක් බවට පත්ව සිටින, 1990 ගනන්වල ලිබරලුන් හා ඔවුන්ගේ දෘෂ්ටිමය උරුමක්කාරයන් පදනම්ව සිටින්නේ, 1980 හා 1990 ගනන්වල ඔවුන්ගේම අත්දැකීම් මතය. ඒ අතරම, ස්ටැලින්වාදයේ අපරාධ හෙලිදරව්වීම යොදාගනු ලැබුවේ, සෝවියට් සංගමයේ සමාජ-ආර්ථික පදනම් අපකීර්තියට පත්කිරීමටත් ධනේශ්වර ප්‍රතිසංස්කරනයේ ක්‍රියාමාර්ගයක් පෙරට ගෙනඒමටත් ය.

විශේෂයෙන්ම එම වසරවල, මෙකී සමාජ ස්ථරයන් ස්ටැලින්ට එරෙහිව ට්‍රොට්ස්කි කල විවේචන තමන්ගේ ම ප්‍රයෝජනය සඳහා යොදාගැනීමට උත්සාහ කලහ "තනිරටක සමාජවාදයේ" න්‍යාය පිලිබඳ විවේචනාත්මක දෘෂ්ටියක් කෙරෙහි ජනතාව ඇදගැනීමට හැකිවෙතැයි යන සංකල්පය මත ඔවුහු ක්‍රියාත්මක වූවා මිස ඔක්තෝබර් විප්ලවයේ සැබෑ ජාත්‍යන්තර ජීවගුනය උකහාගැනීමට නම් යොමු නොවූහ.

ට්‍රොට්ස්කි පිලිබඳ සත්‍යයේ බිඳක් පලකිරීමට අද දිනයේ දැරෙන උත්සාහය පිටුපස අත්තේ ද එවන්

ගනන් බැලීම්ය. අතීතයේදී තමන්ම අපකීර්තියට පත්කරගත් ලිබරල් බුද්ධිමතුන්ගේ ස්ථරයන් කම්කරුවන් අතර තැනක් ලබාගැනීමට උත්සාහ දරන අතර වික්‍රමාන්විත අරගලයේ සිදුවීම් සමග පෙම් කෙලින්නේ තමන්ගේම අවශ්‍යතාවන් සඳහා ය. හොඳින් ගනන් බැලූ උපාමාරුවල යෙදීමෙන් ඔවුහු කම්කරුවන් තම අත යට තබාගැනීමට බලාපොරොත්තු වෙති.

අද දිනයේ පලල් ජනකොටස් අතර ඔක්තෝබර් විප්ලවයේ ඉතිහාසය පිලිබඳව පතුලේ සිට මතුවෙමින් තිබෙන උනන්දුව, ඉහත කී කොටස්වල උත්සාහයන් තුල යාන්තමින් හා විකෘති ආකරයකට පිලිබිඹු කෙරෙයි.

© www.wsws.org